# වසර 155ක උත්තරීතර පොලිස් සේවය.

ශ්‍රී ලංකා පොලිස් සේවය සැප්තැම්බර් මස 03 වන දිනට වසර 155 පිරීම නිමිත්තෙන් මෙම ලිපිය පළවන්නේය. ස්වකිය ඉතිහාසය මෙසේ ප්‍රත්‍යාවර්ජනය කිරීමට යොමුවීම කාලෝචිතය. වාර්ථාගත වුව ද වාර්ථාගත නොවුව ද දීර්ඝ පොලිස් ඉතිහාසය, ජන සමාජයට බද්ධ වු සංසිද්ධින් හා අත්දැකීම් වලින් අනුන අතිශය වැදගත් තොරතුරු හා පුවත් සම්භාරයකින් යුක්තය.

ඓතිහාසික ප්‍රත්‍යාවර්ජනය වු කළී ආයතනික සංවර්ධනයේ පදනම වන්නේය. වඩා යහපත් හා මහජන හිතෛෂිවූත් සංවර්ධනයට උපකාරී වන්නා වූත් පොලිස් සේවයක් ගොඩනැගිමෙහිලා පොලිසියේ ඓතිහාසික තොරතුරු ඉතා වැගත්ය. ක්‍රියාකාරීව පවත්නා සේවයක ඉතිහාසය විමර්ශනය කළ යුත්තේ හුදෙක් ඓතිහාසික වාර්ථාවන් සකස් කිරීමට පමණක් නොවේ. දීර්ඝ කාලීනව ක්‍රියාත්මක වීමෙන් ලද ජයග්‍රහණ හඳුනාගැනීමට ද, ඌනතා හඳුනා ගැනීමට ද, ඉදිරි මඟ සකස් කර ගැනීමට ද, මෙම අතීත විමර්ශණ උපස්තම්භනය වනු ඇත.

පොලිසිය අප හඳුනාගන්නේ නව අපරාධ යුක්ති පද්ධතිය යටතේ එන එක් ආයතනයක් වශයෙනි. අධිකරණය, බන්ධනාගාරය, පරිවාසය ආදී ඊට අනුබද්ධ තවත් ආයතන විය.

ලංකාවේ පොලිස් රාජකාරීන් පිළිබඳ ඉතිහාසය ශතවර්ෂ දෙකකට වඩා පැරණිය. එනමුත් ඊට එහා ගිය පොලිස් ඉතිහාසයක්ද අප සතුය. ලන්දේසි ජාතිකයින් මුහුදු බඩ ප්‍රදේශ අත්පත් කර ගැනීමෙන් අනතුරුව 1650 ජූනි මස 10 දින කොළඹ නගර සභාව සම්මත කරගත් යෝජනාවක් අනුව කොළඹ නගරයේ වෙළඳාම් කටයුතු පාලනය කිරීම සඳහාත්, රාත්‍රී කාලයේ නගර ආරක්ෂාව සොල්දාදුවන් සිව් දෙනෙකු යෙදවීම ලංකාවේ පොලිස් රාජකාරියේ ආරම්භය ලෙසට ඇතැම් මුලාශ්‍රයන්ගෙන් පිළිබිඹුවේ.

ක්‍රමිකව කොළඹ නගරයේ පොලිස් රාජකාරි සඳහා හමුදා සොල්දාදුවන්ද කොටුව ප්‍රදේශයේ ලන්දේසි සොල්දාදුවන්ද, පිටකොටුව ප්‍රදේශයේ මැලේ ජාතික සොල්දාදුවන්ද පොලිස් රාජකාරි ඉටුකර ඇත.

1806 වර්ෂය වන විට ඉංග්‍රීසි ජාතිකයින් කොළඹ නගරයෙන් පිටත පොලිස් රාජකාරි කිරීම සඳහා ආඥා පනතක් සම්මත කරගෙන ඇති අතර 1833 වන විට රජයෙන් ගෙවීමක් කරන පොලිස් සේවයක් ආරම්භවී ඇත. මෙම අවධියේදී කොළඹට පොලිස් අධිකාරිවරයෙකු ලෙස තෝමස් ඔස්ටින් මහතා පත්ව ඇත.

එවකට කොළඹ නගරයේ ජනගහනය වූ 39000 ක පමණ පිරිසට පොලිස් සේවාවන් සැපයීමට පොලිස් නිලධාරින් 165 දෙනෙකුගෙන් සමන්විත පොලිස් කණ්ඩායමක් රාජකාරියේ නිරතව සිට ඇත. මහනුවර නගරයේ පොලිස් රාජකාරි ආරම්භ වී ඇත්තේ 1818 වර්ෂයේදි ප්‍රධාන පොලිස් කොස්තාපල්වරයෙකු හා ඔහු යටතේ උප කොස්තාපල්වරු දෙදෙනෙකුගෙනි. 1843 දී එවකට බල පැවැත්වූ පොලිස් අඥාපනත අවලංගුකර දිවයිනේ ඕනෑම නගරයක පොලිස් ස්ථාන පිහිටුවීමට ආණ්ඩුකාර වරයාට බලය පවරණ ලදි. 1843 වර්ෂයේදී පොලිස් පරීක්ෂක නිලය හඳුන්වා දෙමින් නිලධාරීන් සංඛ්‍යාව වැඩිකර ඇති අතර පොලිස් පියන් තනතුර අවලංගුකර පොලිස් කොස්ථාපල් තනතුරද හඳුන්වා දී ඇත. මධ්‍යම පලාත සඳහා වෙනම පොලිස් අධිකාරිවරයෙකු යටතට පත්කර ඇත්තේ 1848 වර්ෂයේදීය. ප්‍රථම ලාංකීය පොලිස් අධිරිවරයා වූ එල්.බී. දූනුවිල මහතාට එම භාග්‍ය හිමිවීම විශේෂ වේ.

1863 වර්ෂයේ අවසානය වන විට පොලිස් ස්ථාන 48 ක් පිහිටුවා තිබී ඇති අතර පොලිස් ස්ථාන පිහිටුවීමේදී අනුගමනය කළ ප්‍රතිපත්ති අතර එක් ප්‍රතිපත්තියක් වී ඇත්තේ කිසියම් නගරයකින් එකතු කරන වරිපණම් බදු ප්‍රමාණයෙන් එම පොලිසිය නඩත්තු කිරීමට හැකියාව තිබිය යුතුය යන්නය.

එවකට පොලිස් රාජකාරියේ නිරතව සිටි ජී.ඩබ්.ආර්. කැම්බල් මහතා ප්‍රධාන පොලිස් අධිකාරි තනතුරට පත්කිරීමෙන් අණතුරුව පොලිසිය තුල නිලඇඳුම හා පොලිස් සේවයට නවාංග රැසක් එක්කරමින් සංශෝධනයන් රාශියක් සිදුකර ඇත. ඔහුගේම නිර්දේශ අනුව ප්‍රධාන පොලිස් අධිකාරි පදවිය අහෝසිකර දෙපාර්තමේන්තුවේ ප්‍රධානියා පොලිස්පති ලෙස හැඳින්වීමට කටයුතු කර ඇත. වර්ථමානයේ බලපැවැත්වෙන පොලිස් සේවාවේ මුලාරම්භය වශයෙන් සඳහන් කරන්නේ එම සංශෝධනයට අනුව 1866 සැප්තැම්බර් 03 වන දින ප්‍රථම පොලිස්පති ලෙස ශ්‍රීමත් ජී.ඩබ්.ආර්.කැම්බල් මහතා වැඩ භාරගත් දිනයයි. එම සංසිද්ධිය එකම හා අවසාන නිර්නායකය කරගනිමින් එදින ව්‍යවස්ථාපිතව පොලිසිය ආරම්භ කළ දින ලෙස ගණනය කරමින් අද දින 155 වන පොලිස් දිනය ස්මරණය කරනු ලැබේ.

ශ්‍රී ලංකා පොලිසියේ ආරම්භය ලෙස ස්මරණය කිරීමත් එහි අභිමානයත් පොලිස්පති වරයෙකු පත්වීම යන ප්‍රමුඛ කාර්යය ලෙස සලකන්නේ නම් හා පොලිස් ඉතිහාසය ගොඩනැගී ඇත්තේ පොලිස්පති නාමාවලියද සමග බද්ධවී යැයි විශ්වාස කරන්නේ නම් පොලිසියේ දියුණුව, අභිවෘද්ධිය හා එහි ගුණාත්මක භාවය ඉහල නැංවීමේ වැඩි කාර්යභාරයක් පොලිස්පතිවරයා සතු වන්නේය. ඔහුගේ අභිමතය තුල හෝ නිර්දේශ මත නවාංග එකතු කිරීමත්, පවත්නා දේ යථාවත් කිරීමත් , නිලධාරින් බඳවා ගැනීමත්, අපරාධ මත්ද්‍රව්‍ය රිය අනතුරු හා දුසිරිත් පාලනය ප්‍රධාන කරගත් නීතිය ක්‍රියාවේ යෙදවීමේ ඵලදායිතාවයත් රැඳී පවතිනු ඇත. එබැවින් පොලිසිය නැමැති ආයතනයේ සංවර්ධනය සඳහා එක්වූ නවාංග කිවයුතු වන්නේද පොලිස්පති නාමයන් සමගය. එයට අනුව,

ප්‍රථම ශ්‍රී ලාංකික පොලිස්පති ලෙස ශ්‍රිමත් රිචඩ් අලුවිහරේ මහතා පත්වන්නේ නිදහස ලැබීමටත් පෙර 1947 වර්ෂයේදිය. 1948 වර්ෂයේ නිදහස ලැබීමෙන් පසු මෙරට ඇති වූ සමාජ ආර්ථික දේශපාලනමය වෙනස්වීම් වලට සරිලන ලෙස පොලිස් දෙපාර්තමේන්තුවද වෙනස් වෙමින් දිවයින පුරා පොලිස් ස්ථාන වැඩි සංඛ්‍යාවක් ආරම්භකර ඇත.

රටක ජනතාවට බියෙන් සැකෙන් තොර දිවි පෙවෙතක් ගෙන යාමට අදාල සාමය සහ සංහිදියාව සැලසීම ජනතා පරමාධිපත්‍ය හිමි රටක් පාලනය කරන රජයේ පරම වගකීම වේ. නිදහසින් පසු මෙරට ඇති වූ දේශපාලන වෙනස්වීම් වල ප්‍රතිඵලයක් ලෙස මහජන ඡන්දයෙන් රජයන් පත්විය. ජනතාවගේ සියලුම වගකීම් වගවීම් රජයෙන් ඉටු කිරීමට යොදාගත් ප්‍රධාන ආයතන අතර පොලිසියට ප්‍රබල ස්ථානයක් විය. එබැවින් නීතිය සාමය පවත්වාගෙන යාමට බාධාවන සියල්ල මැඩ පැවැත්වීම පොලිසියේ ප්‍රධාන වගකීමක් විය.

මෑත ඉතිහාසයේ පත්වූ පොලිස්පතිවරුන්ගෙන් අපරාධ ස්ථාන පරීක්ෂනාගාරය **(SOCO)** නිර්මාණය කිරීම පොලිස්පති චන්ද්‍රා ප්‍රනාන්දු මහතාගේ උත්සාහයක සාර්ථක ප්‍රතිඵලයකි. මහින්ද බාලසූරිය මහතා ආරම්භ කල 119 පොලිස් ක්ෂණික අමතුම් සේවය කාලිනව ඉතා වැදගත් සේවයක් ඉටුවේ. බහුතරයක් ජනතාව එහි සේවය ලබන අතර පොලිස්පති එන්.කේ ඉලංගකෝන් යුගය පොලිස්පති සහන මැදිරිය,**Tell IGP,** වැනි සේවාවන්ද පොලිසිය තුල ඇති කළ යුතු ප්‍රතිසංවිධාන යෝජනා සකස් කර පොලිස් නිලධාරින්ගේ වැටුප් හා දීමනා පිළිබඳව වඩාත් සාධනීය තිරණ රාශියක් ගත් කාලයක්විය.

වත්මන් පොලිස්පති සි.ඩී වික්‍රමරත්න ශ්‍රී ලංකාවේ 35 වන පොලිස්පති වරයායි. පොලිස්පති සි.ඩී.වික්‍රමරත්න වැඩිම කාලයක් පොලිස්පතිධූරයේ වැඩබැලීමෙන් අනතුරුව පොලිස්පති ධූරයට පත්වූ පොලිස්පතිවරයකු වන අතර තාක්ෂණික මෙවලම් භාවිතයෙන් පොලිස් රාජකාරි කිරිමේ ක්‍රමවේද හදුන්වා දීම,පොලිස් නිලධාරියකුගේ වෘත්තීමය තත්ත්වය නගා සිටුවීමත් විමර්ෂණ පහසුකම් හා දැනුම වැඩිදියුණු කිරීම, පොලිසියට බැදෙන දක්ෂ පොලිස් කොස්තාපල්වරයෙකුට ඉහල තණතුරු සදහා උසස්වීම් ලබීමට අවශ්‍ය මාර්සය හා කාන්තා පොලිස් නිලධාරිනියකට පොලිස්පතිධූරය දක්වා වුවද උසස්වීම් ලැබීමට හැකි ස්ත්‍රී පුරුෂ සමානාත්මතාවයෙන් කටයුතු කිරීම වැනි අනාගත අභියෝගයන් ජය ගැනිමට ඇවැසි මාර්ගෝපදේශ සකස් කරමින් පොලිසිය ප්‍රතිසංවිධානය කිරීමේ කාර්යයක නිරත වෙමින් සිටී.

වත්මන් කාලයේ පොලිසියේ සියලුම රාජකාරින් කොරෝනා වසංගතයෙන් ඇතිවන වෙනස්වීම් හමුවේ වෙනස්කරගත යුතුව ඇත.පොලිස් නිලධාරින් නිදි වර්ජිතව නිවාඩු නොලබා රාජකාරින් සිදුකරණු ලබයි. පොලිස් සේවය හා සෞඛ්‍ය සේවය සේවාදායකයාට නිවසේ සිට ලබා දිය නොහැකිය. ඔවුන්ගේ සේවාවන් ආනුභවිකව සේවාදායකයා අභිමුවෙහි සිට ඉටුකළ යුතුය. වසංගතයෙන් පසුව ජනජීවිතයට බලපාන ආර්ථික සාමාජීය ගැටළු රාශියක් ඇතිවනු නොඅනුමානය. ජීවත්වීමේ අරගලය සදහා දරණ අසංවිධානාත්මක උත්සාහයන් වලදී සිදුවන අපරාධයට, සොරකමට හා නීති විරෝධි ක්‍රියා මැඩලිමට මානුෂිය මුහුණුවරකින් තීරණ ගැනිමට අණපනත් වල හිදැස් නැත.

පොලිස් දෙපාර්තමේන්තුව පොලිස් සේවයක් ලෙස ස්වදේශිය කටයුතු පිළිබද අමාත්‍යාංශය, ආරක්ෂක අමාත්‍යාංශය, අභ්‍යන්තර කටයුතු පිළිබඳ අමාත්‍යාංශය වැනි අමාත්‍යාංශයන් යටතේ මෙන්ම ස්වාධින පොලිස් කොමිෂන් සභාව යටතේද පාලනය වි වත්මන් රජයේ මහජන ආරක්ෂක අමාත්‍යාංශය නමින් වෙනම අමාත්‍යාංශයක් යටතේ පාලනය වේ. පොලිසිය පිළිබඳව සමීක්ෂණයන් සිදුකර තොරතුරු ඒකරාශි කරගනිමින් ක්ෂණිකව වෙනස් විය යුතු දේ හා දීර්ඝකාළින ප්‍රතිපත්ති සකස්කරීමේ කටයුතු මෙහෙයවීම වත්මන් කාළයේ මහජන ආරක්ෂක අමාත්‍යාංශය මගින් සිදුවෙන බොහෝ කටයුතු අතර කිහිපයකි.

අතිගරු ජනාධිපතිතුමාගේ "සෞභාග්‍යයේ දැක්ම" රජයේ ප්‍රතිපත්ති ප්‍රකාශණය අනුව නව පොලිස් ස්ථාන විවෘත කරමින් තවදුරටත් අඩු ජන සනත්වයකින් යුත් ප්‍රදේශයන් වලට පොලිස් ස්ථාන මායිම්කර කාර්යක්ෂම පොලිස් සේවයක් ලබා දීමට කටයුතු කරයි. අත්තිඩිය ප්‍රදේශයේ පොලිස් මුලස්ථානය ඉදිකිරීම සිදුවේ. 2020 වර්ෂය වනවිට 495 ක්ව පැවති පොලිස් ස්ථාන 525 ක් දක්වා අළුතින් පොලිස් ස්ථාන විවෘතවී ඇති අතර තවත් පොලිස් ස්ථාන 190 ක් පමණ ඉදිරියේදී විවෘත වීමට නියමිතය. ප්‍රජා පොලිස් කරණය පිළිබඳ රජයේ අවධානය වඩාත් යොමුකරමින් වෙනම රාජ්‍ය අමාත්‍යවරයෙකු හා වෙනම ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පතිවරයෙකු යටතට පත්කර එය ක්‍රියාත්මක කිරීමේ යාන්ත්‍රණය ශක්තිමත් කර ඇත.

පොලිස් සේවයේ දැනට නිලධාරින් 85000 කට ආසන්න ප්‍රමාණයක් සේවය කරනු ලබන අතර අද දක්වා පොලිස් රාජකාරිය වෙනුවෙන් මියගිය පොලිස් නිලධාරින් ගණන 3000 නට වඩා වැඩිය රාජකාරියේදී ආබාධිත තත්ත්වය පත්වූ නිලධාරින් ගණන1568 කි. පොලිසිය පවතින තාක් කල් ඔවුන් සිහිපත් කරන නමුත් මියගිය හා ආබාධිත පොලිස් නිලධාරින්ගේ නාම ලේඛනයට අළුතින් නම් ප්‍රමාණයක් වාර්ෂිකව එකතුවේ.

පොලිස් නිශ්කාසන වාර්ථා ලෙස දෙස්, විදෙස් රැකියා සඳහා සහතිකපත් නිකුත් කිරිම, නැතිවූ ලියකියවිලි ලබා ගැනිම සඳහා පොලිස් වාර්ථා ඉදිරිපත් කිරිම, ආපදා අවස්ථාවන්හි දි ජනතාවට පහසුකම් සලසාදීම, දිවා රාත්‍රී වාහන ගමනා ගමනයට පහසුකම් සැලසිම, විදි සංචාරය කරමින් ආරක්ෂාව තහවුරු කිරීම වැනි පොලිස් රාජකාරි බොහොමයක් පොලිසිය මගින් සිදුකරණ සමාජ සේවාවන් වේ. දෛනිකව එවැනි සේවාවන් ලබා ගන්නා පිරිසට වඩා වැඩි පිරිසක් තවමත් අපරාධ, මත්ද්‍රව්‍ය, රිය අනතුරු හා දූෂන වැනි ක්‍රියාවන් වලට අත්අඩංගුවට ගැනීමට සිදුවේ.

අපරාධ පාලනය කළ යුත්තේ පොලිසියත් ජනතාවත් කියා වෙන්කරගත් සමාජයක නොව, අප සියල්ලම එකම සමාජයක සාමජිකයින් යැයි සිතන හෝ මිහිබට මිනිසුන් ලෙස සැමට සමානව සිතමින් අනෙකාට ගරු කරන අනෙකාත් ජිවත්විය යුතුයැයි උතුම් සිතුවිලි ඇතිකරගත් දිනක සිටය. එවන් දිනක මහජනතාවගේ තෙලිතුඩින් පොලිස් ඉතිහාසයට ස්වර්ණමය වදන් මෙන්ම පොලිස් විරු නාමයන්ද එකතු වනු ඇත.

පොලිස් මාධ්‍ය කොට්ඨාසය.